නිවසේ සුරතලයට ඇති කරන බැළලිය සමඟ තම සැමියා කායික සම්බන්ධතා පවත්වන බවට බිරිඳ සිදුකළ පැමිණිල්ලක් මත, සැමියා හා බිරිඳ දෙදෙනාම මානසික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවට පොලිසිය සිදු කරන ප්‍රකාශය මාධ්‍ය අවධානයට ලක්ව තිබිණි. කෙසේ නමුත්, බිරිඳගේ එම පැමිණිල්ලෙහි සඳහන් සිදුවීම කෙතරම් සත්‍යද යන්න මෙතෙක් හෙළිදරව් වී නොමැති බවද එම පුවත ඔස්සේම පැවසේ.

ඒ සම්බන්ධයෙන් වාර්තා කරනා දිනමිණ පුවත්පත (සැප්. 14, 2022), "සැමියා පූසිට ලව්" යන සිරස්තලය යටතේ එය ඉදිරිපත් කර තිබිණි. එය එදින දෙරණ අරුණ වැඩසටහන (සැප්. 14, 2022) මඟින් ද ප්‍රකාශයට පත් වී තිබිණි.

ඔබ සිතන ආකාරයට,

සනාථ වී නොමැති මෙම සිදුවීම ඉදිරිපත් කිරීම සඳහා, "සැමියා පූසිට ලව්" වැනි සිරස්තලයක් කෙතරම් උචිත වන්නේ ද? එය භාවාතිශය සිරස්තලයක් නොවන්නේ ද?

භාවාතිශය වාර්තාකරණයෙන් වළකිමු!